Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සතිපාසල

සතිය - 04

විෂය:- නර්තනය

ශ්‍රේණිය :- 11

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

# ජන ගායනාවල සමාජ සංස්කෘතික පසුබිම හඳුනා ගනිමු.

- නර්තනය සමග යෙදෙන ප්‍රධාන අංගයක් ලෙස ගායනය හැඳින්විය හැක.
- ඉදිරිපත් කරන නර්තනය ප්‍රසාංගික ගුණයත් නර්තන අංගය රසවත් කිරීමටත් ගායනය රුකුලක් වේ.
- ගායනයක් ඉදිරිපත් කිරීමේ දී මූලික කරුණු 05ක් සඳහා අවධානය යොමු කළ යුතුය.

- ✓ ගායනයට අදාළ ප්‍රස්තුතය
- ✓ නිවැරදි නාද මාලාව
- ✓ රිද්මය හා කාලය
- ✓ නිවැරදි ශ්‍රැතිය

# -ප්‍රශස්ති-

- බුදුන්, දෙවියන්, රජවරුන්ගේ ගුණ වර්ණනා කරයි
- පැරකුම්බා සිරිත මුල්ම කාව්‍ය ග්‍රන්ථය යි
- නරේන්ද්‍රසිංහ වර්ණනාව, ශෘංගාරාලංකාරය, ඇහැළේපොළ වර්ණනාව ආදිය ප්‍රශස්ති කාව්‍ය ග්‍රන්ථයි.
- මහනුවර යුගයේ ප්‍රශස්ති ජනප්‍රිය විය
- යොදාගත් ගායකයන් වන්දිභට්ටයන් ලෙස හැඳින්වේ
- කවිකාර මඩුවේ දී ගායනා කර ඇත
- රාජ ප්‍රශස්ති, බුද්ධ, දේව ප්‍රශස්ති යනුවෙන් වර්ග කළ හැක
- සංස්කෘත වචන බහුල ව යොදා ගෙන ඇත



| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ^ | | 1 | | | ^ | | 1 | | |
| 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 3 |
| පා | - | නා | - | අ | සි | රි | නො | හැ | ර |
| පා | - | නා | - | දෙ | නෙ | න් | කු | පු | ම |
| පා | - | නා | - | පි | යෙ | ව් | බ | ලැ | නි |
| තුං | - | ත | - | මේ | - | - | - | - | - |

හුනා වැලදි කමල යානා සදද සදෙව්
පීනා සපිරි සිරිනි සංකමේ
පීනා සමර සයුර නානා තනන නතඹ ගානා තෙදිඹු
නෙතහ කුංකුමේ
සේනා සමග මෙකල නා නා සිරින් පවතු භූනාධිපති
රාජ සිංහමේ

චන්ද නම් යස තේජ කුංකුම - ඇන්ද දිග ගනන් උරකල
බින්ද සතුරු අඳුරු පැහැර - බන්දු කමල සේ

නන්ද විජය ශ්‍රී වික්‍රම - රාජසිංහ නම් අප හිමි
නන්ද සිරින් සිරි රැකදෙන් - කන්ද සුරිඳුනේ

රාමචන්ද්‍ර විය රිවි කුල - නාම ගගන කල බබලන
රාජ මෙතුන් සිංහල කිවි - භෝජ රාජනේ

## පන්තේරු කවි

- සබ නැටුම් විශේෂයක් ලෙස හැඳින්විය හැකිය.
- අතීතයේ වෙහෙර විහාරවල සූවිසි විවරණ සත් සති පන්සාලිස් වස වැනි අවස්ථාවල බුදු ගුණ ගයමින් නර්තනය කලා.
- තේරු පහන් ගැටීමෙන් උපදවන හඬ නිසා පන්තේරුව ලෙස හැඳින්වීම.
- පත්තිනි දෙවියන්ගෙන් පළමුව අවසර ගනියි.
- විලම්බ හා මධ්‍යලයෙන් ගායනා කරයි.
- පන්තේරු ඇඳුම් කට්ටලය උඩරට නර්තන සම්ප්‍රදායේ ඇඳුමකි.



| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| සි | ත් | ලෙ | ස | ලො | ව | සැ | දි | ව | කු | - | ව | ල | ල් | ලා | - |
| - | - | - | ව | කු | - | ව | - | ල | ල් | - | - | ලා | - | - | - |

පත්තිනි දෙවිඳුගේ සළඹ වලල්ලා
ගන්නෙ අතට පන්තේරු වලල්ලා

පත්තිනි දෙවිඳුගේ සළඹ වලල්ලා
රුතිනි එවැද බැස අවසර ඉල්ලා
නිතිනි බලා අප රැකිමේ සියල්ලා
අතින් දරටි පන්තේරු වලල්ලා

## කාර්ය පත්‍රිකාව

1) මුල්ම ප්‍රශස්ථි කාව්‍ය ග්‍රන්තය ලියන්න.
2) ප්‍රශස්ති කාව්‍ය ජනප්‍රිය වූ යුගය හා ගායනා කළ ස්ථානය නම් කරන්න.
3) ප්‍රශස්ති වර්ග කර දක්වන්න.
4) ඉහත ප්‍රශස්ථි කවියේ ඉතිරි පද ප්‍රස්ථාර කරන්න.

1) පන්තේරු නර්තනය රඟ දැක්වූ අවස්ථා නම් කරන්න.
2) පන්තේරු නර්තනය සඳහා මුලින්ම අවසර ඉල්ලනුයේ.
3) ඉහත සඳහන් පන්තේරු කවියේ ඉතිරි පද ප්‍රස්ථාර කරන්න.

## ඉගෙනුම් ආධාරක

https://www.youtube.com/watch?v=YP2B3Lueszk&t=169s

https://www.youtube.com/watch?v=AQtIUdkeLaI

https://www.youtube.com/watch?v=p52sMogti3I